**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2023**

**2025 අගෝස්තු / සැප්තැම්බර්**

**සමාජීය විද්‍යා පීඨය**

# භූගෝල විද්‍යාව

**(නව නිර්දේශය)**

## භෞතික භූගෝල විද්‍යාව - GEOG 18214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "භෞතික භූගෝලවිද්‍යා විෂය ඒකකය අධ්‍යයනය කිරීමෙන් පාරිසරික අර්බුද රැසක් සඳහා විසඳුම් සපයා ගත හැකිය." මෙම ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න. (ලකුණු 20)

02. භෞම පද්ධතිය සකස් වී ඇති ප්‍රධාන කොටස් හඳුන්වා දී එම කොටස් අතර පවතින අන්තර් සම්බන්ධතා පෙන්වා දෙන්න. (ලකුණු 20)

03. සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යයා ඇතුළු ග්‍රහලෝකවල උපත පිළිබඳ ඉදිරිපත් වී ඇති මතවාද අතුරින් දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. තැටි චලන න්‍යාය (Plate Techtronic Theory) හා මහාද්වීපික ප්ලාවිත සංකල්පය (Continental Drift Concept) අතර පවතින සම්බන්ධතාව පරීක්ෂා කරන්න. (ලකුණු 20)

05. ඛණිජ, පාෂාණ හා පස හඳුන්වා දී මේවා අතර පවතින සම්බන්ධතාව පරීක්ෂා කරන්න. (ලකුණු 20)

06. දේශගුණ විපර්යාසය (Climate Change) මානව කටයුතුවලට බලපාන ආකාරය පිළිබඳව විග්‍රහ කරන්න. (ලකුණු 20)

07. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ජල සම්පත් ආශ්‍රිත ගැටලු හතරක් (04) නම්කර ඒවා විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් වැඩසටහනක් යෝජනා කරන්න. (ලකුණු 20)

08. මතු සඳහන් මාතෘකා අතුරින් දෙකකට (02) සංක්ෂිප්ත සටහන් ඉදිරිපත් කරන්න.

    1. ඩේවිස්ගේ ඛාදන චක්‍ර සංකල්පය (Davisian Model of Cycle of Erosion)
    2. සී.ජී. රොස්බීගේ වායුගෝලීය සංසරණය පිළිබඳ ත්‍රිශෛලාකාර මතය
    3. බෝෆට් පරිමාණය (Beaufort Scale)
    4. රිච්ටර් පරිමාණය (Richter Scale) (ලකුණු 10x2=20)

****************************